

# දඟකාර පුංචි සමනලී

තරුෂි උමායා කුමාරී
තෙන්නකෝන්

කෘතියේ නම - දඟකාර පුංචි සමනලී

ප්‍රථම මුද්‍රණය- 2025.02.08

කතාව සහ චිත්‍ර - තරුෂි උමායා කුමාරි තෙන්නකෝන්

කතෘගේ ලිපිනය- 250/B ස්වර්ණ විමන, ඒදඬුවාව, පේරාදෙණිය.

පාසල- මහමායා බාලිකා විද්‍යාලය.

ශ්‍රේණිය- 2 ශ්‍රේණිය B

කතෘගේ වෙනත් කෘති- කුරුළු පැටියට කරදරයක්

පරිගණක අක්ෂර සහ පිටු සැකසීම- ඒකනායක පොත්හල

නො. 308/C ගම්පොල පාර පේරාදෙණිය

ISBN අංකය - 978-624-208-365-0

# පිදුම...

ආදරණීය මහමායා විදුහල් මෑණියන්ට

මේ පොත

ආදරයෙන් පුදකරමි.

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක රටක
එක කැලෑවක
පුංචි සමනලීයි
එයාගේ අම්මයි
ජීවත් වුණා.



එක දවසක් සමනලීගේ අම්මා බඩු ගන්න යන්න ලෑස්ති වුණා. අම්මා යන්න කලින් පුංචි සමනලීට ගෙයින් එළියටවත් කැලේටවත් යන්න එපා කිව්වා.



අම්මා ගියාට පස්සේ පූංචි සමනලිට හරිම පාළුයි. ඉතින් එයා හෙමින් ගෙයින් එලියට ආවා.





සමනලී කැලේ ලස්සන මල් පලතුරු
බලමින් ඈතට ඈතට ගියා.



පුංචි සමනළී කැලේ අතරමං වුණා.

එයා හොඳටම බය වුණා.

එයා මලක් උඩට වෙලා හොඳටම

ඇඬුවා.





ඔන්න එතකොට මී මැස්සෝ රංචුවක් ආවා. මී මැස්සෝ සමනලීගෙන් ඇහුවා ඇයි අඬන්නේ කියලා. සමනලී මී මැස්සන්ට හැමදේම කිව්වා.



මී මැස්සෝ සමනලීට ගෙදර යන්න උදව් කළා.



බඩු ගන්න ගිය අම්මා ගෙදර ඇවිත් පුංචි සමනලීව හැම තැනම හෙව්වා. සමනලී නැතුව අම්මා හොඳටම ඇඬුවා.



මී මැස්සෝ එක්ක ගෙදර ආපු පුංචි සමනලී දැකපු අම්මාට හරි සතුටුයි. එයා මී මැස්සන්ට ගොඩක් ස්තූති කළා.



පුංචි සමනලී ආයේ කවදාවත් අම්මාට අකීකරු වුණේ නැහැ.

ඒ දෙන්නා සතුටින් ජීවත් වුණා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්